Department of Education,Sabaragamuwa Province/ Weekly School

- **දුවේ පුතේ"**
- **කියවීම් පොතේ ඇති තරු කැට කවි පෙළ තාලයට ගායනා කරන්න**

**තරු කැට**

ආකාසේ නිල් තරු කැට
පියාඹලා මහ පොළොවට
සේපාලිකා මල් ගහ උඩ
දිලිසෙනවා කදිම රුවට
මාල පොටක් පොඩි නංගිට
හදා දෙන්න පුළුවනි මට
නූල් පටක් අරන් අතට
හෙමින් ගියා ගහ ගාවට
සර සර ගා එක රෑනට
ඉගිල්ලුණා නිල් තරු කැට
කණාමැදිරියනි ආයෙත්
සමා වෙලා එන්න බිමට
රත්න ශ්‍රී විජේසිංහ මහතාගේ
**සැළලිහිණියෝ පොතෙන් උපුටා ගන්නා ලදී.**

- **කවිපෙළ ඇසුරින් පිළිතුරු ලියන්න.**

1) මහ පොළොවට පියාඹා ආවේ මොනවා ද ?.......................................................
2)මාල පොට සාදන්නේ කාට ද ?.....................................................................
3)නූල් පට අරගෙන ගියේ කොහේට ද ?...........................................................

- **ඔබත් කවි පෙළක් නිර්මාණය කරන්න. දෙමාපියනි, උදව් කරන්න.**
- **මාතෘකාව:- මල්**

1)මල් ගැන කවියක් නිර්මාණය කරන්නේ නම්,
2)බොහෝ මල් වර්ග ඇති බව
3)පාට පාට මල් වර්ග ඇති බව
4)මල් සුවඳවත් බව
5)තම වත්තේ ඇති මල් ගැන
6)දැක ඇති මල් වත්තක් ගැන
7)මල් පිපෙන තැන් ගැන
8)මල් යොදා ගන්නා අවස්ථා ආදිය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න